ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


## සන්නිවේදන දෙපාර්තමේන්තුව

30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk


# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2020 අගෝස්තු මස 14 දින |

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2020 ජූනි

## සමස්ත නිරීක්ෂණ

| | 2020 ජූනි | 2020 ජනවාරි - ජූනි |
|---|---|---|
| වෙළඳ ශේෂය (↓) | එ.ජ.ඩො. මිලියන 161<br>2019 ජූනි එ.ජ.ඩො. මිලියන 316 | එ.ජ.ඩො. මිලියන 3,262<br>2019 ජන. - ජූනි එ.ජ.ඩො. මිලියන 3,597 |
| වෙළඳ භාණ්ඩ අපනයන (↓) | එ.ජ.ඩො. මිලියන 894<br>2019 ජූනි එ.ජ.ඩො. මිලියන 1,084<br>-17.5% වාර්ෂික ලක්ෂ්‍යමය | එ.ජ.ඩො. මිලියන 4,413<br>2019 ජන. - ජූනි එ.ජ.ඩො. මිලියන 5,999<br>-26.4% වාර්ෂික ලක්ෂ්‍යමය |
| වෙළඳ භාණ්ඩ ආනයන (↓) | එ.ජ.ඩො. මිලියන 1,055<br>2019 ජූනි එ.ජ.ඩො. මිලියන 1,400<br>-24.6% වාර්ෂික ලක්ෂ්‍යමය | එ.ජ.ඩො. මිලියන 7,675<br>2019 ජන. - ජූනි එ.ජ.ඩො. මිලියන 9,596<br>-20.0% වාර්ෂික ලක්ෂ්‍යමය |

**සංචාරක ඉපැයීම්**
2020 ජූනි: -
2020 ජන. - ජූනි: එ.ජ.ඩො. මිලියන 956 (-49.7% වාර්ෂික ලක්ෂ්‍යමය) (↓)

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**
2020 ජූනි: එ.ජ.ඩො. මිලියන 572 (6.7% වාර්ෂික ලක්ෂ්‍යමය) (↑)
2020 ජන. - ජූනි: එ.ජ.ඩො. මිලියන 2,980 (-8.9% වාර්ෂික ලක්ෂ්‍යමය) (↓)

| කොළඹ කොටස් වෙළඳපොළ (ද්විතියික වෙළඳපොළ-ශුද්ධ) | රාජ්‍ය සුරැකුම්පත් (ශුද්ධ) | දළ නිල සංචිත | විනිමය අනුපාතිකය (එ.ජ ඩොලරයට රුපියල්) |
|---|---|---|---|
| 2020 ජූනි: එ.ජ.ඩො. මිලියන -46<br>2020 ජන. - ජූනි: එ.ජ.ඩො. මිලියන -112 | 2020 ජූනි: එ.ජ.ඩො. මිලියන -38<br>2020 ජන. - ජූනි: එ.ජ.ඩො. මිලියන -492 | 2020 ජූනි අග - එ.ජ.ඩො. බිලියන 6.7<br>(ආනයනික මාස 4.5) | 2019 දෙසැ. අග - 181.6340<br>2020 ජූනි අග - 186.2292 |













ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

## සමස්ත නිරීක්ෂණ

දේශීය ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් සාමාන්‍ය වීමත් සමඟ, ශ්‍රී ලංකාවේ විදේශීය අංශය 2020 වසරේ ජූනි මාසයේ දී තවදුරටත් ස්ථාවර විය. භාණ්ඩ අපනයන නැවත යථා තත්ත්වයට පත් වීම අපේක්ෂිත මට්ටම ඉක්මවා සිදු වීම සහ අත්‍යවශ්‍ය නොවන ආනයන සඳහා පනවා ඇති සීමාවන් හේතුවෙන් භාණ්ඩ ආනයනය සැලකිය යුතු ලෙස අඩු වීමත් සමඟ, පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව 2020 වසරේ ජූනි මාසයේ දී වෙළඳ හිඟය අඩු විය. කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වීමෙන් පසු ප්‍රථම වතාවට විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ජූනි මාසයේ දී වර්ධනයක් වාර්තා කළේය. මෙම මාසය තුළ, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් ගෙවීම් වාර්තා විය. වෙළඳ හිඟය අඩු වීම හේතුවෙන් ශ්‍රී ලංකා රුපියල 2020 වසරේ ජූනි මාසයේ දී සුළු අතිප්‍රමාණය වීමක් වාර්තා කළේය.

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2019 ජූනි එ.ජ.ඩො. මිලියන | 2020 ජූනි එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2019 ජන.- ජූනි එ.ජ.ඩො. මිලියන | 2020 ජන.- ජූනි එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 1,084 | 894 | -17.5 | 5,999 | 4,413 | -26.4 |
| ආනයන | 1,400 | 1,055 | -24.6 | 9,596 | 7,675 | -20.0 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -316 | -161 | | -3,597 | -3,262 | |
| සංචාරක ඉපැයීම් | 119 (ආ) | - | -100.0 | 1,901 (ආ) | 956 (ඇ) | -49.7 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 537 | 572 | 6.7 | 3,270 | 2,980 | -8.9 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | 10 | -46 | | -10 | -111 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 2,176 | 116 | | 5,555 | 1,196 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 49 | 3 | | 376 | 90 | |
| දිගුකාලීන ණය | 127 | 113 | | 779 | 1,106 | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 2,000 | - | | 4,400 | - | |
| විදේශ ඍජු ආයෝජන (ඉ) | | | | 255 | 192 | |
| සමස්ත ශේෂය | | | | 1,827 | -760 | |

**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2020 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.
(ඈ) ද්විතීයික සහ ප්‍රාථමික ගනුදෙනු ඇතුළත් වේ.
(ඉ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස තුන සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි ඍජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ ඍජු ආයෝජන ඇතුළත් වේ.

## වෙළඳ හිඟය හා වෙළඳ මිල අනුපාතය

- 2009 වසරේ අගෝස්තු මාසයට පසුව අඩුම මාසික වෙළඳ හිඟය වාර්තා කරමින් **වෙළඳ ගිණුමේ හිඟය** 2019 වසරේ ජූනි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 316 සිට 2020 වසරේ ජූනි මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 161ක් දක්වා අඩුවිය. එසේම, සමුච්චිත වශයෙන් සැලකූ විට වෙළඳ හිඟය, 2019 වසරේ පළමු මාස හය තුළදී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන

3,597ට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස හය තුළ දී එ.ජ.ඩොලර් මිලියන 3,262ක් දක්වා එ.ජ.ඩොලර් මිලියන 335කින් අඩු විය. 2020 වසරේ පළමු මාස හය තුළ දී වෙළඳ හිඟය අඩු වීම සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූප සටහන 01 මගින් දැක්වේ.

- මේ අතර, අපනයන හා ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන **වෙළඳ මිල අනුපාතය** 2020 වසරේ ජූනි මාසයේ දී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 7.3කින් පහත වැටුණු අතර, ආනයන මිල ගණන් පහත වැටීමේ වේගයට වඩා වැඩි වේගයකින් අපනයන මිල ගණන් පහත වැටීම මේ සඳහා හේතු විය.

**රූප සටහන 1: වෙළඳ හිඟය අඩු වීම සඳහා දායක වූ ප්‍රධාන අයිතම : 2020 ජනවාරි - ජූනි (එ.ජ. ඩොලර් මිලියන)**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2019 – 2020)**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2019 – 2020)**




**මූලය** : ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

- **වෙළඳ භාණ්ඩ අපනයන** ආදායම තියුණු ලෙස වර්ධනය වෙමින් 2020 වසරේ මැයි මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 587ට සාපේක්ෂව 2020 වසරේ ජූනි මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 894ක් වාර්තා කළේය. රටේ ආර්ථික කටයුතු ක්‍රමයෙන් නැවත ආරම්භ කිරීම මෙන්ම දේශීය හා ගෝලීය යන දෙඅංශයේම සැපයුම් සහ ඉල්ලුම් දාම යම්තාක් දුරට යථා තත්ත්වයට පත්වීම අපනයනවල මෙම වර්ධනය සඳහා දායක විය. 2020 වසරේ මැයි මාසයේ සිට 2020 වසරේ ජූනි මාසය දක්වා අපනයන ආදායමෙහි ඇති වූ ඉහළ යෑමට රෙදිපිළි හා ඇඟළුම් අපනයන ආදායම ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, රබර් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, මුහුදු ආහාර සහ කුළුබඩු අපනයන ආදායම ද ඒ සඳහා දායක වී ඇත.
- කෙසේ වුවද, වෙළඳ භාණ්ඩ අපනයන ආදායම 2019 වසරේ ජූනි මාසයට සාපේක්ෂව 2020 වසරේ ජූනි මාසයේ දී සියයට 17.5කින් කැපී පෙනෙන ලෙස පහත වැටුණි. පෙර වසරට සාපේක්ෂව අපනයන ආදායම අඩු වීම සඳහා කාර්මික අපනයන අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු විය. අනෙකුත් නිමකළ රෙදිපිළි ද්‍රව්‍ය යටතේ වර්ග කර ඇති මුහුණු ආවරණ, ආරක්ෂිත ඇඳුම් කට්ටල වැනි පෞද්ගලික ආරක්ෂක උපකරණ අපනයන ආදායම ඉහළ ගිය ද, පෙර වසරට සාපේක්ෂව 2020 වසරේ ජූනි මාසයේ දී කාර්මික අපනයන ආදායම පහත වැටීම සඳහා රෙදිපිළි හා ඇඟලුම් අපනයන අඩු වීම විශාල වශයෙන් දායක විය. ප්‍රවාහන උපකරණ, ඛනිජ තෙල් නිෂ්පාදිත, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ සහ සත්ත්ව ආහාර වැනි කාර්මික අපනයන යටතේ වර්ග කර ඇති බොහෝ උපකාණ්ඩ අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව මෙම මාසය තුළ දී පහත වැටුණි. ශල්‍ය හා වෙනත් අත් වැසුම් අපනයනය ඉහළ ගිය ද, ප්‍රධාන වශයෙන් ටයර් අපනයනය පහත වැටීම හේතුවෙන් රබර් නිෂ්පාදිත ආශ්‍රිත අපනයන ආදායම පහත වැටුණි. කෙසේ වුවද, 2019 වසරේ ජූනි මාසයට සාපේක්ෂව ආහාර, පාන වර්ග හා දුම්කොළ (ප්‍රධාන වශයෙන් දියර පොල්කිරි, පොල් සාරය සහ සකස් කළ දුම්කොළ), ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් රෙදි වර්ග සඳහා භාවිත කරන ප්ලාස්ටික් උපාංග) සහ රසායනික නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් සක්‍රීය කාබන්) අපනයන ආදායම 2020 වසරේ ජූනි මාසයේ ඉහළ ගියේය.
- 2019 වසරේ මැයි මාසයට පසුව ප්‍රථම වරට 2020 වසරේ ජූනි මාසයේ දී කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 12.0කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මෙම වර්ධනය සඳහා සකස් නොකළ දුම්කොළ හැර කෘෂිකාර්මික අපනයන යටතේ වර්ග කර ඇති සියලුම උපකාණ්ඩවල අපනයන ඉහළ යෑම හේතු විය. තේ අපනයන පරිමාව සුළු වශයෙන් පහත වැටුණ ද, තේ සඳහා වූ සාමාන්‍ය අපනයන මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් මාස දහයකට පසුව 2020 වසරේ ජූනි මාසයේ දී තේ අපනයන ආදායම ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් පුවක්, පලතුරු සහ බුලත් අපනයන ඉහළ යෑම හේතුවෙන් සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය. කුරුඳු සහ ගම්මිරිස් අපනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් කුළුබඩු අපනයන ආදායම ඉහළ ගිය අතර, පොල් මද ආශ්‍රිත නිෂ්පාදිතවල සාමාන්‍ය අපනයන මිල ගණන් ඉහළ යෑම සහ පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිතවල අපනයන පරිමා ඉහළ යෑම හේතුවෙන් පොල් අපනයන ආදායම ඉහළ ගියේය.

- ප්‍රධාන වශයෙන් ලෝපස්, ලෝබොර හා අලු අපනයන ආදායම අඩු වීම හේතුවෙන් 2020 වසරේ ජූනි මාසයේ දී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව ඛනිජ අපනයන ආදායම පහළ ගියේය.
- 2019 වසරේ ජූනි මාසයට සාපේක්ෂව 2020 වසරේ ජූනි මාසයේ දී අපනයන පරිමා දර්ශකය සියයට 2.5කින් ඉහළ ගිය අතර, අපනයන මිල දර්ශකය සියයට 19.5කින් පහත වැටුණි. මෙමගින් 2019 වසරේ ජූනි මාසයට සාපේක්ෂව 2020 වසරේ ජූනි මාසයේ දී අපනයන පහත වැටීම සඳහා සමස්තයක් වශයෙන් අපනයන මිල ගණන් පහත වැටීම හේතු වූ බව පිළිබිඹු වේ. කෙසේ වුවද, 2020 වසරේ මැයි මාසයට සාපේක්ෂව 2020 වසරේ ජූනි මාසයේ දී අපනයන පරිමා දර්ශකයේ වර්ධනය සියයට 61.7ක සැලකිය යුතු ඉහළ අගයක් වූ අතර, අපනයන මිල දර්ශකයේ පහළ යෑම සියයට 5.7ක සාපේක්ෂව අඩු අගයක් විය.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: මාසික අපනයන පරිමා දර්ශකය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)

| කාණ්ඩය | ජුනි 2019 (එ.ජ. ඩො. මිලියන) | ජුනි 2020 (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) | ජන.-ජුනි 2019 (එ.ජ. ඩො. මිලියන) | ජන.-ජුනි 2020 (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **875.4** | **661.3** | **-24.5** | **4,728.6** | **3,357.1** | **-29.0** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 31.0 | 41.7 | 34.5 | 233.4 | 197.8 | -15.2 |
| සත්ත්ව ආහාර | 19.4 | 11.3 | -41.8 | 70.7 | 49.2 | -30.4 |
| රෙදිපිළි හා ඇඟලුම් | 505.3 | 403.7 | -20.1 | 2,761.4 | 1,943.9 | -29.6 |
| එයින් ඇඟලුම් | 472.3 | 323.0 | -31.6 | 2,570.8 | 1,734.2 | -32.5 |
| රෙදිපිළි | 23.4 | 20.8 | -10.8 | 138.0 | 105.9 | -23.2 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 9.7 | 59.8 | 516.8 | 52.6 | 103.8 | 97.2 |
| රබර් නිෂ්පාදිත | 79.1 | 66.0 | -16.6 | 442.1 | 335.7 | -24.1 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 19.9 | 11.2 | -43.8 | 151.0 | 72.8 | -51.8 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 34.4 | 30.2 | -12.1 | 206.5 | 146.5 | -29.1 |
| ප්‍රවාහන උපකරණ | 67.6 | 7.7 | -88.6 | 107.2 | 30.9 | -71.2 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 35.6 | 16.7 | -53.0 | 241.9 | 219.5 | -9.3 |
| රසායනික නිෂ්පාදිත | 15.5 | 16.0 | 3.3 | 87.9 | 75.3 | -14.3 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 10.8 | 8.0 | -25.3 | 70.7 | 44.4 | -37.2 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.9 | 1.9 | 0.1 | 23.3 | 15.1 | -35.4 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 8.9 | 5.9 | -34.4 | 58.1 | 26.1 | -55.1 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.0 | 6.9 | 14.9 | 36.3 | 26.7 | -26.5 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 13.8 | 9.6 | -30.3 | 90.7 | 55.5 | -38.8 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 2.8 | 1.4 | -49.7 | 14.1 | 9.1 | -35.7 |
| වෙනත් කාර්මික අපනයන | 23.5 | 23.2 | -1.4 | 133.1 | 108.7 | -18.3 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **204.5** | **229.1** | **12.0** | **1,245.1** | **1,039.0** | **-16.6** |
| තේ | 113.2 | 114.9 | 1.6 | 684.9 | 571.7 | -16.5 |
| රබර් | 1.7 | 2.9 | 68.4 | 15.0 | 13.5 | -10.1 |
| පොල් | 29.3 | 34.2 | 16.9 | 173.2 | 146.8 | -15.2 |
| කුළුබඩු | 24.5 | 31.5 | 28.6 | 143.6 | 113.8 | -20.7 |
| එළවළු | 2.3 | 3.9 | 68.0 | 16.0 | 13.8 | -13.4 |
| සකස් නොකළ දුම්කොළ | 3.5 | 1.3 | -62.8 | 16.6 | 9.5 | -42.5 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 8.6 | 16.0 | 87.1 | 52.3 | 70.7 | 35.3 |
| මුහුදු ආහාර | 21.4 | 24.3 | 13.7 | 143.6 | 99.1 | -31.0 |
| **3. ඛනිජමය අපනයන** | **2.8** | **1.6** | **-42.7** | **16.7** | **9.7** | **-41.8** |
| **4. වර්ග නොකළ අපනයන** | **1.2** | **2.1** | **69.9** | **8.8** | **7.0** | **-20.7** |
| **මුළු අපනයන** | **1,084.0** | **894.1** | **-17.5** | **5,999.2** | **4,412.8** | **-26.4** |

(අ) තාවකාලික

***මූලයන්:*** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරීත්වය

- 2019 වසරේ දෙසැම්බර් මාසයේ සිට 2020 වසරේ මැයි මාසය දක්වා සිදු වූ පහළ වැටීමේ ප්‍රවණතාවය වෙනස් කරමින් **වෙළඳ භාණ්ඩ ආනයන** වියදම 2020 වසරේ ජූනි මාසයේ දී ඉහළ ගිය ද, එය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 24.6කින් පහත වැටුණි. 2020 වසරේ ජූනි මාසයේ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,055ක් විය. 2020 වසරේ ජූනි මාසයේ දී සියලුම ප්‍රධාන ආනයන කාණ්ඩවල වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව පහත වැටුණු අතර, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන වියදම විශාල වශයෙන් පහත වැටුණි. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ අයහපත් බලපෑම් අඩුකිරීමට රජය සහ මහ බැංකුව විසින් 2020 වසරේ මාර්තු මාසයේ සිට තෝරා ගත් භාණ්ඩ ආනයනය සීමා කිරීම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ ඉන්ධන ආනයන වියදම විශාල වශයෙන් පහළ යෑම, ආනයන පුළුල් පරාසයක් තුළ අඩුවීම සඳහා දායක විය.
- අන්තර් භාණ්ඩ ආනයන අඩුවීම ආනයන වියදම පහත වැටීම සඳහා විශාල වශයෙන් දායක විය. 2019 වසරේ ජූනි මාසයට සාපේක්ෂව 2020 වසරේ ජූනි මාසයේ දී ඉන්ධන ආනයන වියදම කැපී පෙනෙන ලෙස පහත වැටුණු අතර, ඒ සඳහා පිරිපහදු කළ ඛනිජතෙල් සහ බොරතෙල් සඳහා වූ වියදම අඩු වීම හේතු විය. ආනයන පරිමාව අඩුවීම සහ ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඉන්ධන මිල ගණන් පහත වැටීම ඉන්ධන ආනයන වියදමෙහි මෙම පහත වැටීමට හේතු විය. බොරතෙල් බැරල් එකක සාමාන්‍ය ආනයන මිල පෙර වසරේ අනුරූප මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් 67.29 සිට 2020 වසරේ ජූනි මාසයේ දී එ.ජ.ඩොලර් 38.35ක් දක්වා පහත වැටුණි. ප්‍රධාන වශයෙන් රෙදි හා කෙඳි වර්ග ආනයනය පහත වැටීම හේතුවෙන් 2020 වසරේ ජූනි මාසයේ දී රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම කැපී පෙනෙන ලෙස පහත වැටුණි. කෙසේ වුවද, 2019 වසරේ ජූනි මාසයට සාපේක්ෂව මෙම මාසයේ දී පොහොර (ප්‍රධාන වශයෙන් යූරියා), ඛනිජ නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් සිමෙන්ති ක්ලින්කර), සකස් නොකළ දුම්කොළ සහ කෘෂිකාර්මික යෙදවුම් (ප්‍රධාන වශයෙන් සත්ත්ව ආහාර) ආනයන වියදම ඉහළ ගියේය.
- සියලුම උපකාණ්ඩවල ආනයන පහත වැටීමත් සමඟ 2020 වසරේ ජූනි මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම කැපී පෙනෙන ලෙස පහත වැටුණි. ඒ අනුව, 2019 වසරේ ජූනි මාසයට සාපේක්ෂව 2020 වසරේ ජූනි මාසයේ දී යන්ත්‍රසූත්‍ර හා උපකරණ (ප්‍රධාන වශයෙන් වෛද්‍ය හා රසායනාගාර උපකරණ), ගොඩනැගිලි ද්‍රව්‍ය (ප්‍රධාන වශයෙන් යකඩ හා වානේ උපාංග) සහ ප්‍රවාහන උපකරණ (ප්‍රධාන වශයෙන් ටැංකි හා බවුසර වැනි වාණිජ කටයුතු සඳහා භාවිත කරනු ලබන රථවාහන) ආනයන වියදම පහත වැටුණි. කෙසේ වුව ද, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී යන්ත්‍රසූත්‍ර හා උපකරණ කොටස් සහ සිමෙන්ති ආනයන වියදම ඉහළ ගියේය.
- ආහාර හා පාන වර්ග ආනයන වියදම ඉහළ ගිය ද, ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටීම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි. ප්‍රධාන වශයෙන් 2020 වසරේ මාර්තු මාසයේ සිට ආනයන සීමා කිරීම සඳහා රජය සහ මහ බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් 2020 වසරේ ජූනි මාසයේ දී රථවාහන ආනයන

වියදම සියයට 80.9කින් කැපී පෙනෙන ලෙස පහත වැටුණු අතර, ප්‍රධාන වශයෙන් ශීතකරණ සහ රූපවාහිනි ආනයන පහත වැටීම හේතුවෙන් ගෘහ උපකරණ ආනයනය ද පහත වැටුණි. කෙසේ වුවද, 2020 වසරේ ජූනි මාසයේ දී බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත සහ විදුලි සංදේශ මෙවලම් (ප්‍රධාන වශයෙන් ජංගම දුරකථන) ආනයන වියදම ඉහළ ගියේය. මේ අතර, ආහාර හා පාන වර්ග ආනයන වියදම ඉහළ ගිය අතර, ඒ සඳහා මුහුදු ආහාර (ප්‍රධාන වශයෙන් කරවල), කිරි නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් කිරිපිටි), එළවළු (ප්‍රධාන වශයෙන් පරිප්පු), තෙල් හා මේදය (ප්‍රධාන වශයෙන් පොල්තෙල්) සහ කුළුබඩු (ප්‍රධාන වශයෙන් මිරිස් සහ කොත්තමල්ලි ඇට) ආනයනය ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතුවිය.

- 2020 වසරේ ජූනි මාසයේදී ආනයන පරිමා දර්ශකය සහ මිල දර්ශකය යන දර්ශක දෙක ම පිළිවෙළින් සියයට 13.2කින් සහ සියයට 13.1කින් පහත වැටුණු අතර, 2019 වසරේ ජූනි මාසයට සාපේක්ෂව ආනයන පහත වැටීම සඳහා ආනයන පරිමාව මෙන්ම ආනයන මිල ගණන් පහළ යෑම ද හේතු වූ බව මෙයින් පිළිබිඹු වේ.

**රූප සටහන 6: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: මාසික ආනයන පරිමා දර්ශකය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | ජූනි 2019 (එ.ජ. ඩො. මිලියන) | ජූනි 2020 (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) | ජන.-ජූනි 2019 (එ.ජ. ඩො. මිලියන) | ජන.-ජූනි 2020 (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **258.1** | **249.1** | **-3.5** | **1,811.0** | **1,782.1** | **-1.6** |
| ආහාර හා පාන වර්ග | 97.7 | 101.9 | 4.4 | 689.9 | 787.3 | 14.1 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 2.1 | 1.0 | -51.9 | 16.3 | 16.8 | 2.5 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 17.5 | 21.0 | 20.3 | 151.6 | 181.1 | 19.4 |
| එළවළු | 23.3 | 26.5 | 13.7 | 141.3 | 202.3 | 43.2 |
| මුහුදු ආහාර | 15.1 | 22.6 | 50.0 | 107.3 | 107.5 | 0.2 |
| සීනි හා රසකැවිලි | 19.3 | 12.9 | -33.0 | 104.3 | 116.4 | 11.5 |
| කුළුබඩු | 5.9 | 7.9 | 33.4 | 50.1 | 67.7 | 35.2 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 14.5 | 10.0 | -31.1 | 118.9 | 95.6 | -19.6 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 160.5 | 147.1 | -8.3 | 1,121.1 | 994.8 | -11.3 |
| පෞද්ගලික රථවාහන | 48.1 | 9.2 | -80.9 | 324.2 | 273.4 | -15.7 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 38.4 | 60.8 | 58.5 | 249.2 | 274.7 | 10.2 |
| ගෘහ මෙවලම් | 12.2 | 6.3 | -48.8 | 97.6 | 83.0 | -14.9 |
| රෙදිපිළි හා උපාංග | 18.3 | 17.5 | -4.7 | 134.2 | 111.0 | -17.3 |
| විදුලි සංදේශ මෙවලම් | 14.3 | 29.4 | 105.7 | 115.1 | 101.4 | -12.0 |
| ගෘහ හා දැව භාණ්ඩ | 12.2 | 13.3 | 8.7 | 75.3 | 70.5 | -6.4 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 16.9 | 10.7 | -36.4 | 125.6 | 80.9 | -35.6 |
| **2. අන්තර් භාණ්ඩ** | **842.6** | **564.8** | **-33.0** | **5,546.4** | **4,166.8** | **-24.9** |
| ඉන්ධන | 284.5 | 110.4 | -61.2 | 2,001.0 | 1,243.4 | -37.9 |
| එයින් බොරතෙල් | 92.5 | 26.8 | -71.0 | 491.3 | 251.4 | -48.8 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 192.0 | 83.6 | -56.4 | 1,384.5 | 865.6 | -37.5 |
| ගල්අඟුරු | 0.0 | 0.0 | 55.7 | 125.2 | 126.4 | 1.0 |
| දියමන්ති හා අගනා ගල් වර්ග | 6.9 | 6.9 | 0.7 | 88.1 | 39.2 | -55.5 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 226.6 | 175.7 | -22.5 | 1,394.8 | 1,065.6 | -23.6 |
| කඩදාසි හා ඝන කඩදාසි | 31.6 | 26.0 | -17.8 | 211.3 | 175.2 | -17.1 |
| කෘෂිකාර්මික යෙදවුම් | 13.8 | 15.8 | 14.7 | 94.4 | 101.8 | 7.8 |
| තිරිඟු හා ඉරිඟු | 32.7 | 27.8 | -15.0 | 143.4 | 156.5 | 9.1 |
| මූල ලෝහ | 60.8 | 13.6 | -77.7 | 277.5 | 171.2 | -38.3 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 45.5 | 28.9 | -36.4 | 289.9 | 228.3 | -21.2 |
| රසායනික නිෂ්පාදිත | 61.4 | 62.9 | 2.5 | 411.5 | 378.9 | -7.9 |
| පොහොර | 8.2 | 22.2 | 171.8 | 93.4 | 107.0 | 14.6 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 16.3 | 13.7 | -16.0 | 108.8 | 110.2 | 1.3 |
| ඛනිජ නිෂ්පාදිත | 9.7 | 18.4 | 88.6 | 108.4 | 78.5 | (27.6) |
| වෙනත් අන්තර් භාණ්ඩ | 44.5 | 42.4 | -4.8 | 323.9 | 310.9 | -4.0 |
| **3. ආයෝජන භාණ්ඩ** | **299.0** | **240.9** | **-19.4** | **2,235.6** | **1,715.2** | **-23.3** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 176.8 | 146.4 | -17.2 | 1,232.4 | 990.0 | -19.7 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 98.6 | 77.9 | -21.0 | 725.5 | 495.2 | -31.7 |
| ප්‍රවාහන උපකරණ | 23.3 | 16.2 | -30.3 | 274.5 | 228.5 | -16.8 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.3 | 0.3 | -2.9 | 3.2 | 1.5 | -53.9 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.1** | **0.7** | **347.6** | **3.0** | **10.5** | **252.3** |
| **මුළු ආනයන** | **1,399.8** | **1,055.5** | **-24.6** | **9,596.0** | **7,674.6** | **-20.0** |
| **ඉන්ධන නොවන ආනයන** | **1,115.3** | **945.0** | **-15.3** | **7,595.1** | **6,431.2** | **-15.3** |

(අ) තාවකාලික

***මූලයන් :*** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

- කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2020 ජූනි මාසයේ දී අඛණ්ඩව තුන්වන මාසය සඳහා **සංචාරක පැමිණීම්** කිසිවක් වාර්තා නොවීමත් සමඟ, 2019 වසරේ පළමු මාස හය තුළ දී පැමිණි 1,008,449ක සංචාරකයන් ප්‍රමාණය හා සැසඳීමේ දී 2020 වසරේ පළමු මාස හය තුළ සමුච්චිත සංචාරක පැමිණීම් ප්‍රමාණය 507,311ක් ලෙස පැවතුණි.
- ඒ අනුව, සංචාරක පැමිණීම් මත පදනම්ව ඇස්තමේන්තුගත කෙරෙන **සංචාරක ඉපැයීම්** 2020 වසරේ පළමු මාස හය තුළ දී එ.ජ. ඩොලර් මිලියන 956ක් වූ අතර, එය 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 49.7ක අඩුවීමකි.
- ප්‍රධාන වශයෙන් මැද පෙරදිග රටවල සේවය කරන සංක්‍රමණික සේවකයින්ට ලැබුණු උත්සව දීමනා හේතුවෙන්, පෙර වසරේ ජූනි මාසය සමඟ සැසඳීමේ දී 2020 ජූනි මාසයේ දී **විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ** එ.ජ. ඩොලර් මිලියන 572ක් දක්වා සියයට 6.7ක වැඩිවීමක් වාර්තා කළේය. කෙසේ වෙතත්, සමුච්චිත පදනම මත සැලකූ විට, 2019 වසරේ පළමු මාස හයට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස හය තුළ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 2,980ක් දක්වා සියයට 8.9ක අඩුවීමක් වාර්තා කළේය.

**රූප සටහන 8: මාසික සංචාරක පැමිණීම්**




**මූලය**: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 9: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**




**මූලයන්**: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූලය ලැබීම්

- 2020 වසරේ ජූනි මාසයේ දී රුපියල්වලින් නාමනය කරන ලද **රාජ්‍ය සුරැකුම්පත්** වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 38ක විදේශීය ආයෝජන ශුද්ධ ගෙවීමක් වාර්තා වීමත් සමඟ, සමුච්චිත පදනම මත, 2020 වසරේ පළමු භාගය තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 492ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ආයෝජන ප්‍රමාණය 2020 වසරේ ජූනි මාසය අවසන් වන විට එ.ජ. ඩොලර් මිලියන 88ක් ලෙස ඉතා අඩු මට්ටමක පැවතුණි.
- 2020 වසරේ ජූනි මාසයේ දී **කොළඹ කොටස් වෙළඳපොළෙහි** ද්විතීයික වෙළඳපොළ තුළින් එ.ජ. ඩොලර් මිලියන 46ක ශුද්ධ ගෙවීම් වාර්තා විය (2020 ජූනි මාසයේ දී ප්‍රාථමික වෙළඳපොළ ලැබීම් වාර්තා නොවීය). සමුච්චිත පදනම මත, 2020 වසරේ පළමු භාගය තුළ දී කොළඹ කොටස් වෙළඳපොළ එ.ජ. ඩොලර් මිලියන 111ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.
- තවද, 2020 වසරේ ජූනි මාසයේ දී රජය වෙත වූ **දිගු කාලීන ණය** වශයෙන් වූ ශුද්ධ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 34ක් විය.

## ජාත්‍යන්තර සංචිත

- 2020 වසරේ ජූනි මස අවසානය වන විට **දළ නිල සංචිත** ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 6.7ක් වූ අතර, එය ආනයනික මාස 4.5කට සමාන විය. දළ නිල සංචිත සහ බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2020 වසරේ ජූනි මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 9.5ක් වූ අතර, එය ආනයනික මාස 6.3කට සමාන විය.

**රූප සටහන 10: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

- 2020 අප්‍රේල් මස මැද භාගයේ සිට අඛණ්ඩව අතිප්‍රමාණය වූ ශ්‍රී ලංකා රුපියල, 2020 ජූනි මාසයේ දී ද එම ප්‍රවණතාවයම පවත්වා ගනිමින් සියයට 0.03ක සුළු අතිප්‍රමාණය වීමක් වාර්තා කළේය. 2020 මැයි මස ආරම්භයේ සිට පැවති තියුණු අතිප්‍රමාණය වීම සමඟ 2020 අගෝස්තු මස 14 වැනි දින දක්වා වූ කාලය තුළ දී එ.ජ. ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියලෙහි සමස්ත අවප්‍රමාණය වීම සියයට 0.6කට සීමා විය. සංචිත ඉහළ නංවා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අඛණ්ඩව දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වීම් සිදු කරන ලදී. මේ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් 2020 වසර මුල සිට අගෝස්තු මස 14 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී රුපියල, යූරෝ, ස්ටර්ලින් පවුම, ජපන් යෙන් සහ ඕස්ට්‍රේලියානු ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය වූ අතර, ඉන්දියානු රුපියලට සාපේක්ෂව අතිප්‍රමාණය විය.

**රූප සටහන 11: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2018 | 2019 | 2020 (අගෝ. 14 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | -16.4% | +0.6% | -0.6% |
| යූරෝ | -12.7% | +2.6% | -5.6% |
| ස්ටර්ලින් පවුම | -11.4% | -2.8% | -0.02% |
| ජපන් යෙන් | -18.1% | -1.0% | -2.1% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -7.6% | +1.3% | -2.4% |
| ඉන්දියානු රුපියල | -8.7% | +2.6% | +4.3% |

**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව